# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,752 — 1959 මැයි 29 වැනි සිකුරාද — 29.5.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස—පළාත් පාලනය

එක් එක් කොටස වෙන වෙනම බැඳ තබාගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | | | | පිට |
|---|---|---|---|---|
| පළාත් පාලන නිවේදන | ... | ... | | — |
| තනතුරු-ඇබෑර්තු | ... | ... | | 481 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | ... | ... | | — |
| අතුරු ව්‍යවස්ථා | ... | ... | | 483 |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | ... | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | | ... | 484 |
| අය-වැය ලේඛන | ... | ... | — |
| දේපළ විකිණීම | ... | ... | — |
| මාගී කොමිටි දැන්වීම් | ... | ... | — |
| විවිධ දැන්වීම් | ... | ... | 485 |


## තනතුරු—ඇබෑර්තු

**ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි**

1. **දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥා පනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥාපනත පිළිබඳ ව තවදුරටත් කෙරෙන සංශෝධනවලට ද ඒ ආඥාපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුර ද ස්ත්‍රීන් නො වන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥා පනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරු කරනු ලැබූ දිනයට ඉස්සරින් දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටු වන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3 ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට, දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම වර්ෂයක ආධුනික කාලයකට හෝ වර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් ස්වකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා ''ලාංකික'' යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූ වෙකි.

5. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

7. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට මී අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටින් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයන් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

......................................තනතුර සඳහා වූ අයදුම්පත යි.

(1) දැන්වීමේ සම්බන්ධය :————.

(2) සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

ජාතිය :————.

(ඉහත සඳහන් 4 වැනි කොන්දේසියේ අර්ථ නිරූපණය අනුව ලාංකිකයෙක් ද නැද්ද යනු සඳහන් කරනු)

(3) සම්පූර්ණ තැපැල් ලිපිනය :————.

(4) වයස හා උපන් දිනය :————.

(5) උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

(6) විවාහක ද අවිවාහක ද ? :————.

(7) අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය (දිනයත් සමඟ)—

(අ) ඉංග්‍රීසි :————.

(ආ) සිංහල/දෙමළ :————.

(8) ඉගෙන ගත් පාඨශාලාව සහ පාඨශාලාවෙන් අස්වූ දිනය : ————.

(9) (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා :————. (දිනයන් හා සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර ද සඳහන් කළ යුතුය.)

(ආ) මීට කලින් ආණ්ඩුව යටතේ සේවය කෙළේ නම් සේවය නතර කිරීමේ හේතුවත් සමඟ සේවය පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

(ඇ) පළාත් පාලන සේවා සාමාජිකයෙක් නම්—

(i) දැනට දරන තනතුරේ නම සහ ශ්‍රේණිය :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) පළාත් පාලන මණ්ඩලවල සේවය පිළිබඳ වාර්තා සටහන :————.

(ඈ) සේවා මුක්ත භටයෙක් නම්—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණු දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

(10) සිංහල හා දෙමළ යන භාෂා කියවීම, ලිවීම හා භාෂණ පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාව :————.

(11) විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————. (වෘත්තීය හා ශිල්පීය සුදුසුකම් ආදිය මෙනි)

(12) විශේෂ හිමිකම් ආදියක් ඇතොත් ඒ පිළිබඳ විස්තර : ————.

(අයදුම්කරු ඉල්ලුම්කරු සිටින තනතුර වැනි තනතුරක සේවය කිරීමෙන් ලබා ඇති පළපුරුද්ද මෙනි)

(13) තෝරා ගනු ලැබුවහොත්, බලාපොරොත්තු වන වැටුප : ————.

(14) චරිත සහතික ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම :————.

(ඒ සහතිකවල මුල් ලිපි නොව ඒවායේ පිටපත් පමණක් ඇමිණිය යුතුයි)

(15) පළාත් පාලන සේවය යටතේ සේවය කෙළේ ද, එසේ නම් කිසියම් අවස්ථාවක සේවය නතර කරනු ලැබුවේද ? ————.

(16) කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

(17) ණයතුරුස් වලින් හෝ මුදල් කරදර වලින් නිදහස් ද : ————.

(18) ප්‍රධාන මුලාදෑනියාගෙන් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගෙන් හෝ සමාදාන විනිශ්චයකාරයකුගෙන් හෝ දේවගැතිවරයකුගෙන් හෝ ලබාගත් පදිංචිය පිළිබඳ සහතික (පදිංචිය පිළිබඳ සහතිකයක් අවශ්‍ය වන අවස්ථාවල දී) : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවයේ 2 වැනි ශ්‍රේණියට අයත් ආයුර්වේද වෛද්‍ය තනතුරු

පළාත් පාලන සේවයේ 2 වැනි ශ්‍රේණියට අයත් ආයුර්වේද වෛද්‍ය තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව ඉල්ලුම් පත්‍ර කැඳවයි.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 960—17 × 72—රු. 2,184, එහි රු. 1,608 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) අයදුම් කරුවෝ, 1949 අංක 49 දරන දේශීය වෛද්‍ය සංශෝධන ආඥාපනතේ දෙවැනි වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබුවෝ විය යුත්තාහ.

(ආ) අයදුම් කරුවන්ට ලංකා ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයයේ ස්වදේශීය වෛද්‍ය විද්‍යාව හා ශල්‍යකර්ම විධි පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන සහතිකයක් හෝ ලංකාවේ හෝ ඉන්දියාවේ පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක වඩා උසස් සහතිකයක් හෝ තිබිය යුතු අතර, ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍ය වරයෙකු ලෙස අවුරුදු 7කට නොඅඩු කාලයක් වෛද්‍ය කර්මයෙහි යෙදී සිටි පළපුරුද්ද තිබිය යුතුයි. 1953 සැප්තැම්බර් මාසයෙන් පසු අවසාන පරීක්ෂණයෙන් සමත් වී, අලුත් අධ්‍යයන පරිපාටිය සම්පූර්ණ කල ඩී. අයි. ඇම්. සහ ඇස්. (ලංකා) උපාධිධරයින් සම්බන්ධයෙන් ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු පළපුරුද්ද තිබීම අවශ්‍ය නොවේ.

(ඇ) සුප්‍රසිද්ධ ගුරු වෛද්‍ය වරයෙකු යටතේ යටත් පිරිසෙයින් පස් වර්ෂයක ශිෂ්‍ය භාවයෙහි යෙදීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයෙකු ලෙස වර්ෂ දහයකට නොඅඩු කාලයක් තුල කරන ලද ව්‍යාප්ත වෛද්‍ය අභ්‍යාසයක් ඇති පිළිගත් සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයන්ගේ ඉල්ලුම් පත්‍රද මීට ඉහතින් සඳහන් කරන ලද සුදුසුකම් නොතකා සලකා බලනු ලැබේ. එබඳු අයදුම් කරුවෝ සවකීය අයදුම් පත්‍ර සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියාගෙන් සහ ගුරු වෛද්‍ය වරයාගෙන් ලබාගත් සහතිකද ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුත්තාහ.

(ඈ) මේ තනතුර සඳහා ඉල්ලුම් කර සිටින පළාත් පාලන සේවා 3 වැනි ශ්‍රේණියේ ආයුර්වේද වෛද්‍ය වරුන් කෙරෙහි වැඩි සැලකිල්ල දක්වනු ලැබේ.

4. තෝරාගනු ලැබූ අයදුම් කරුවන්ට පෞද්ගලික වෛද්‍ය කර්මයෙහි යෙදීමට අවසර නැත. ආයුර්වේද බෙහෙත් ශාලාවන්ට ආසන්නයෙහි පදිංචිවන ලෙස ඔවුන්ට නියම කරනු ඇත.

5. අයදුම් කරුවෝ සවකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලිපි පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (බව්තිස්ම සහතිකය හෝ ආධාර ලබන පාඨශාලාවල රෙගුලාසි පද්ධතිය වෙනුවෙන් නිකුත් කරන ලද සහතික හෝ දිවුරුම් පෙත්සම් නොපිළිගනු ලැබේ.)

(ආ) සාමාන්‍ය ආයුර්වේද වෛද්‍ය වරයෙකු ලෙස වෛද්‍ය කර්මයෙහි යෙදීමේ පළපුරුද්ද පිළිබඳව ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියාගේ සහතිකය (එහි පළපුරුද්ද පිළිබඳ කාල පරිච්ඡේදය සඳහන් විය යුතුයි.)

6. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර පත්වීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි සාරානුකූලව පිළියෙල කොට 1959යේ ජූනි 15 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති තුමා වෙත (පහත අත්සන් කරන අයගේ පෞද්ගලික නමට නොවේ) පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි පහත සඳහන් ශීර්ෂයන් යටතේ දක්වෙන කරුණු වෙනුවට පහත සඳහන් කොට ඇති කරුණු යොදා ගත යුතුයි:—

9. (ඊ) දැනට කරන රක්ෂාව :————.

(i) දැනට කරන තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට මුලින්ම පත්වූ දිනය දක්වන්න :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) පළාත් පාලන ආයතන යටතේ සේවය කොට ඇත්නම් ඒ පිළිබඳ සේවා සටහන් :————.

11. (ඒ) ආයුර්වේද පිළිබඳ සුදුසුකම් සහතික පිටපත් ඇමිණිය යුතුයි :————.

(බී) ඒ සුදුසුකම් ලැබූ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ නාම : ————.

(සී) සුදුසුකම් ලැබූ දින :————.

(ඩී) 1949 අංක 49 දරණ ස්වදේශීය වෛද්‍ය සංශෝධන ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ ලේඛනයෙහි හෝ සාමාන්‍ය ලේඛනයෙහි ලියා පදිංචිවූ අංකය :————.

12. (i) සුදුසුකම් ලැබීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයෙකු ලෙස වෛද්‍ය කර්මයෙහි යෙදීම ආරම්භකල දිනය (එය සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අමුනන්න) :————.

(ii) ආයුර්වේදයේ එක්තරා අංශයක් විශේෂයෙන් අධ්‍යයනය කලේද? එසේනම් විස්තර දක්වන්න :————.

8. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුලත සවකීය ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත් ඒ බව වහාම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් තුමා වෙත දන්වා එවිය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් ඉල්ලුම් පත්‍රය සලකා බැලීම සඳහා කිසියම් හිමිකමක් වෙයි නම් එය නැතිවී යන්නේ ය.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ වැඩ බලන සභාපති.

1959 මැයි මස 23 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

## අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—ඩී137/46.
ඇල්.ජී.ඩී.—ජීජේ 9/19/1.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ 61 වැනි වගන්තියත් සමග කියැවෙන එකී ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ උඩපත්තු ගම් ප්‍රදේශයේ කටයුතු පාලනය කරන නිලධාරියා විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි මස 2 වැනි දින,
කොළඹ පළාත් පාලන කාර්‍යාලයේදිය.

### තොටුපල පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. කාර්‍ය සභාව විසින් ගම් ප්‍රදේශය ඇතුලත තොටුපලක් පිහිටුවනු ලබන කල්හි එකී තොටුපල පිහිටුවීම පිළිබඳව සභාපති තුමා විසින් අණබෙර ගැස්වීමෙන් දැන්වීමක් කළ යුතුය.

2. කාර්‍ය සභාව විසින් පිහිටුවනු ලබන්නාවූ හෝ නඩත්තුකරගෙන යනු ලබන්නාවූ හෝ කිසියම් තොටුපලක ගාස්තු එකතුකිරීමේ අයිතිය (අ) පෞද්ගලික ගිවිසුමකින්, (ආ) ප්‍රසිද්ධ වෙන්දේසියකින් හෝ (ඇ) ටෙන්ඩර් මාර්ගයෙන් ඕනෑම කෙනෙකුට බදු දීමට එකී කාර්‍ය සභාවට පිළිවන.

3. කාර්‍ය සභාව විසින් පිහිටුවනු ලබන්නාවූ හෝ නඩත්තු කරගෙන යනු ලබන්නාවූ හෝ කිසියම් තොටුපලකින් අයකරන සියලුම ගාස්තු සභාපතිතුමා විසින් ලියවිල්ලකින් පත්කරන නොවියෙකු විසින් හෝ බදුකරුවා විසින් හෝ සභාපතිතුමාගේ ලියවිල්ලකින්වූ අනුමැතිය ඇතිව බදුකරුවා විසින්, ඒ ඒ කාරණයේ හැටියට, පත්කරනු ලබන කිසියම් අයෙකු විසින් හෝ එකතුකළ යුතු වන්නේ ය.

4. තොටුපල පාවිච්චිකිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සඳහන් කරන ලද දැන්වීමක් තොටුපලේ කාටත් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනයකරවීමට සභාපති තුමා විසින් කටයුතු සැලැස්විය යුතු අතර, කිසිවෙකු විසින් එකී දැන්වීමේ සඳහන් එම ගාස්තුවලට වඩා වැඩිවූ කිසිම ගාස්තුවක් කිසිවෙකුගෙන් අයකළ යුතු හෝ ලබාගත යුතු හෝ නොවන්නේය.

5. මගීන් ගෙනයාම හෝ බඩුබාහිරාදිය හෝ රථවාහන රැගෙන යාම හෝ සඳහා තොටුපලේ සපයා ඇති යාත්‍රාව ඒ සඳහා පාවිච්චි නොකරන කල්හි කිසියම් තොටුපලක් සම්බන්ධයෙන් පනවනු ලබන ගාස්තු නොගෙවිය යුතුවාත් හැර අයකළ යුතුද නොවන්නේ ය.

6. විධිවූ පරිදි පත් කරනු ලැබූ තොටියකු නොවූ වෙනත් කිසිවකු විසින් කිසියම් ගඟක හෝ දෙළක කාර්‍ය්‍ය සභාව විසින් විධිවූ පරිදි ගාස්තු පනවන ලද කිසියම් තොටුපලකින් හෝ කිසියම් තොටුපලක සිට හෝ ගඟ ඉහළට හෝ ගඟ පහළට හෝ හැතැප්ම බාගයක් ඇතුළත කිසියම් ඔරුවකින් හෝ වෙනත් කිසියම් ඔරු පාරු විශේෂය කින් හෝ සවකීය දේපලක් නොවූ කිසියම් බඩු බාහිරයයක් රථ වාහනයක් හෝ සතෙකු හෝ සවකීය සේවයෙහි නියුක්ත නොවූ කිසියම් මගියකු හෝ කිසියම් ගාස්තුවකට හෝ පාරිතෝෂික මුදලකට හෝ එගොඩ මෙගොඩ කළයුතු නැත.

7. කාර්‍ය්‍ය සභාවෙන් කලින් ලබාගත් අවසරය නොමැතිව ගම් ප්‍රදේශය ඇතුළත පෞද්ගලික තොටුපලක් පිහිටවිය යුතු නැත.

8. කාර්‍ය්‍ය සභාව විසින් නඩත්තුකරගෙන යනු ලබන සියලුම තොටු පලවල් පිළිබඳ ලේඛණයක් තබාගැනීමට සභාපතිතුමා විසින් කටයුතු සැලස්විය යුතුය.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපතිතුමා" යනුවෙන් කාර්‍ය්‍ය සභාවේ සභාපතිතුමා හෝ ගම් සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡෙදය) 61 වැනි වගන්තිය යටතේ පත් කරන ලද නිලධාරියකු විසින් ගම් ප්‍රදේශයේ කටයුතු පාලනය කරනු ලබන කල්හි එකී නිලධාරියා හෝ අදහස් කරනු ලැබේ.

"කාර්‍ය්‍යසභාව" යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදේශය" යනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ උඩපත්තු ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

ඇල්. ඩි.—බී 14/16.

ඇල්.ජී.ඩී—ජී ජේ 9/19.

### ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපනතේ 61 වැනි වගන්තියත් සමග කියැවෙන එකී ආඥාපනතේ (198 වැනි පරිච්ඡෙදය) 49 වැනි වගන්තිය යටතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ උඩපත්තු ගම් ප්‍රදේශයේ කටයුතු පාලනය කරන නිලධාරියා විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරනලද එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් නැන.

1959 මැයි 2 වැනි දින,
කොළඹදීය.

### කුරුවිට වෙළෙඳපොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

කුරුවිට-ඒරත්න පාර, රත්නපුර-කොළඹ පොදු වැඩ දෙපාර්ත මේන්තුවේ පාරට හමුවන ස්ථානයේ සිට සැතපුම් එකක අර්ධ විෂ් කම්භය ඇති චක්‍රයක් ඇතුළත ප්‍රදේශය, කුරුවිට ගම්බද වෙළඳපොළ සඳහාවූ වෙළඳපොළ ප්‍රදේශය වශයෙන් මෙයින් ප්‍රකාශකර සිටිනු ලැබේ.

## ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ

### අම්බලන්ගොඩ නගර සභාව

1958 වර්ෂයේ ලැබීම් සහ ගෙවීම් පිළිබඳ වාර්තාව යි

| | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| **ලැබීම් :** | | | | |
| (ඒ) සාමාන්‍ය ... ... | 2,00,931 | 94 | | |
| (බී) මංමාවත් ... ... | 3,744 | 60 | | |
| (සී) තානායම් සහ අම්බලම් ... | 5,089 | 27 | | |
| (ඩී) නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 3,273 | 73 | | |
| (ඊ) මහජන සෞඛ්‍යය ... | 29,737 | 16 | | |
| (ඇෆ්) මහජන ක්‍රීඩා ... ... | 20,720 | 79 | | |
| (ජී) සොහොන්බිම් ... ... | — | | | |
| (එච්) සුනඛයින් ලියා පදිංචි කිරීම ... | 25 | 50 | | |
| (අයි) තරාදි පඩි හා සේරු ... | — | | | |
| (ජේ) විදුලි දෙපාර්තමේන්තුව ... | 1,89,471 | 57 | | |
| (ඇම්) කියවීම් ශාලා හා පුස්තකාල ... | — | | | |
| සම්පූර්ණ ආදායම ... ... | | | 4,52,994 | 56 |
| **වෙනත් ලැබීම් :** | | | | |
| තැන්පත් මුදල් ... ... | 29,771 | 19 | | |
| අත්තිකාරම් මුදල් ... ... | 17,966 | 32 | | |
| ලංකා සේවින්ස් බැන්කුවේ ආරක්ෂිත ගණනය ... ... | 300 | 0 | | |
| පුස්තකාලයට ආධාර මුදල ... | 2,300 | 0 | | |
| තානායමට ආධාර මුදල ... ... | 2,000 | 0 | | |
| ක්‍රීඩා භූමියට ආධාර මුදල ... | 10,000 | 0 | | |
| ධීවර කාර්මිකයන්ගේ නිවාසවලට ආධාර මුදල ... ... ... | 88,000 | 0 | | |
| ස්ථාවර තැන්පත් මුදල ... ... | 30,375 | 0 | | |
| සම්පූර්ණ වෙනත් ලැබීම් ... ... ... | | | 1,80,712 | 51 |
| 1957 දෙසැම්බර් 31 වෙනි දිනට ශෙෂය ... ... | | | 6,754 | 29 |
| එකතුව ... ... | | | 6,40,461 | 36 |

| | රු. | ශ. | රු. | ශ |
|---|---|---|---|---|
| **ගෙවීම් :** | | | | |
| (ඒ) සාමාන්‍ය වැය ... ... | 51,630 | 34 | | |
| (බී) මංමාවත් ... ... | 79,319 | 17 | | |
| (සී) තානායම් සහ අම්බලම් ... | 5,468 | 19 | | |
| (ඩී) නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 10,970 | 58 | | |
| (ඊ) මහජන සෞඛ්‍යය ... | 1,21,600 | 48 | | |
| (ඇෆ්) මහජන ක්‍රීඩා ... ... | — | | | |
| (ජී) සොහොන්බිම් ... ... | — | | | |
| (එච්) සුනඛයින් ලියා පදිංචි කිරීම ... | 67 | 50 | | |
| (අයි) තරාදි පඩි හා සේරු ... | — | | | |
| (ජේ) විදුලි දෙපාර්තමේන්තුව ... | 1,41,065 | 15 | | |
| (ඇම්) කියවීම් ශාලා හා පුස්තකාල ... | 1,023 | 99 | | |
| සම්පූර්ණ වියදම ... ... | | | 4,11,145 | 40 |
| **වෙනත් ගෙවීම් :** | | | | |
| තැන්පත් මුදල් ... ... | 18,714 | 89 | | |
| අත්තිකාරම් මුදල් ... ... | 16,320 | 78 | | |
| ලංකා සේවින්ස් බැන්කුවේ ආරක්ෂිත ගණනය ... ... | 76 | 60 | | |
| තානායමට ආධාර මුදල ... | 2,125 | 59 | | |
| ධීවර කාර්මිකයන්ගේ නිවාසවලට ආධාර මුදල ... ... | 114 | 50 | | |
| ස්ථාවර තැන්පත් මුදල ... ... | 15,912 | 71 | | |
| ලංකා බැන්කුව, ගාල්ල, ඉතිරි කිරීමේ ගණනය ... ... | 21 | 62 | | |
| තැපැල් කාර්‍ය්‍යාලයීය ඉතිරි කිරීමේ බැන්කුව | 25 | 0 | | |
| ලංකා සේවින්ස් බැන්කුව, ඉතිරි කිරීමේ ගණනය ... ... | 9 | 37 | | |
| ණය මුදල් මාර්ග සංවර්ධන ... | 2,511 | 28 | | |
| ණය මුදල් නිවාස ක්‍රම, 1 වෙනි කොටස ... | 15 | 0 | | |
| ආධාර මුදල් නිවාස ක්‍රම 3 වෙනි කොටස ... | 15,710 | 0 | | |
| සම්පූර්ණ වෙනත් ගෙවීම ... ... | | | 71,557 | 34 |
| 1958 දෙසැම්බර් 31 වෙනි දිනට ශෙෂය ... ... | | | 1,57,758 | 62 |
| එකතුව ... ... | | | 6,40,461 | 36 |

අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති, සැමසන් රණසූරිය වන මම ඉහත කී වාර්තාව මාගේ උසස්ම දැනීමේ හා විශ්වාසයේ හැටියට අම්බලන්ගොඩ නගර සභාව වෙනුවෙන් 1958 වර්ෂය තුළ ලබන ලද හා ගෙවන ලද සියළුම මුදල් පිළිබඳ සැබෑ හා නිවැරදි වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

1959ක්වූ පෙබරවාරි මස 10 වෙනි දින අම්බලන්ගොඩ නගර ශාලාවේ දී යැ.

සැම් රණසූරිය,
සභාපති.

ඉහත කී වාර්තාව නිවැරදි බවට සහතික කරමි.
ඕ: ඇන්. පියසේන,
සභික.

1959ක්වූ පෙබරවාරි මස 10 වෙනි දින අම්බලන්ගොඩ දී මා ඉදිරිපිට සහතික කරන ලදී.

ඇස්. වී. සීලා ද සිල්වා (මහත්මිය),
සමාදාන විනිශ්චයකාර.

**1958ක්වූ දෙසැම්බර් මස 31 වෙනි දිනට වත්කම් සහ බැරකම් පිළිබඳ වාර්තාව යි**

| බැරකම් : | | රු. ශ. |
|---|---|---|
| තැන්පත් මුදල් ... ... | ... | 54,824 96 |
| අගය අඩුවීම් පිළිබඳ ගණන, විදුලි අංශය ... | ... | 4,220 36 |
| පාරවල් පිළිබඳ ණය මුදල ... | ... | 4,398 61 |
| නිවාස ක්‍රම තුන්වෙනි කොටස සඳහා ආධාර මුදල | ... | 77,732 30 |
| පුස්තකාලයට ආධාර මුදල ... | ... | 5,193 84 |
| ත්‍යානායමට ආධාර මුදල ... ... | ... | 2,610 46 |
| ක්‍රීඩා භූමියට ආධාර මුදල ... | ... | 10,000 0 |
| ධීවර කාර්මිකයන්ගේ නිවාසවලට ආධාර මුදල | ... | 87,885 50 |
| 1958 වර්ෂයේ අය ... | රු. 4,52,994.56 | |
| 1958 වර්ෂයේ වැය ... | ,, 4,11,145.40 | |
| 1958 වර්ෂයේ අධිකය ... | ,, 41,849 16 | |
| 1957 වර්ෂයේ හිඟය ... | ,, 29,913.47 | |
| 1958.12.31 දිනට අධිකය | ,, 11,935 69 | ... 11,935 69 |
| එකතුව ... ... | ... | 2,58,801 72 |

| වත්කම් : | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් මුදල් ... ... | | ... | 45,880 36 |
| නිවාස ක්‍රම දෙවෙනි කොටස සඳහා අත්තිකාරම් මුදල ... ... | | ... | 1,392 18 |
| ස්ථාවර තැන්පත් මුදල ... ... | | ... | 51,007 32 |
| ලංකා බැන්කුව, ගාල්ල, ඉතිරි කිරීමේ ගණනය ... ... | | ... | 1,103 59 |
| තැපැල් කාර්‍යාලයීය ඉතිරි කිරීමේ බැන්කුව | | ... | 648 18 |
| ලංකා සේවින්ස් බැන්කුව ඉතිරි කිරීමේ ගණනය ... ... | | ... | 384 87 |
| ලංකා සේවින්ස් බැන්කුවේ, නිළධාරීන්ගේ ආරක්ෂිත ගණනය ... ... | | ... | 626 60 |
| අතේ ඉතිරි ... ... | | 7,304 47 | |
| සුළු මුදල් ඉතිරි ... ... | | 250 0 | |
| ලංකා බැන්කුවේ ඉතිරි ... | රු. 1,21,735.63 | | |
| මුදල් නොගෙව් චෙක් පත් | ,, 3,906 50 | | |
| | ,, 1,17,829.13 | | |
| ගණන් නො ගත් චෙක් පත් | ,, 6,378 08 | | |
| | ,, 1,24,207.21 | | |
| බැන්කුව අඩු කර ගත් බද්ද ... | ,, 7.82 | | |
| මුදල් පොතට ගිය බැංකුවේ | ,, 1,24,215.03 | | |
| මුදල් නො ලැබු චෙක් පත | ,, 9,543.15 | | |
| | | 1,33,758 18 | |
| මර්කන්ටයිල් බැන්කුවේ ඉතිරි ... | ,, 23,829.78 | | |
| මුදල් නොගෙව් චෙක් පත් | ,, 7,415.77 | | |
| | ,, 16,414.01 | | |
| ආණ්ඩුව අඩු කර ගත් බද්ද ... | ,, 15.90 | | |
| චෙක් පොතේ මිල ... | ,, 16.06 | | |
| | | 16,445 97 | |
| | | | 1,57,758 62 |
| එකතුව ... ... | | ... | 2,58,801 72 |

අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති සැම්සන් රණසූරිය වන මම ඉහත කී වාර්තාව මාගේ උසස් ම දැනීමේ හා විශ්වාසයේ හැටියට සැබෑ හා නිවැරදි එකක් බවට මෙයින් සහතික කරමි.

1959ක්වූ පෙබරවාරි මස 10 වෙනි දින අම්බලන්ගොඩ නගර ශාලාවේ දීය.

සැම් රණසූරිය,
සභාපති.

ඉහත කී වාර්තාව නිවැරදි බවට සහතික කරමි.

ඕ. ඇන්. පියසේන,
සභික.

1959ක්වූ පෙබරවාරි මස 10 වෙනි දින, අම්බලන්ගොඩ දී මා ඉදිරිපිට සහතික කරන ලදී.

ඇස්. වී. සීලාද සිල්වා (මහත්මිය),
සමාදාන විනිශ්චයකාර.

අම්බලන්ගොඩ නගර සභාවේ, සභාපති තැන විසින් ඉදිරිපත් කරන ලද, එම නගර සභාවේ ගිණුම් මාගේ විධානය යටතේ පරීක්ෂා කළ බවත්, මේ ගිණුම් පිළිබඳව එහි සභාපති තැනට සපයන්නාවූ වාර්තාවට ඇතුළත් කරන කියමනාවලට යටත් කොට, 1958වේ දෙසැම්බර් 31 වන ද අම්බලන්ගොඩ නගර සභාවේ කටයුතු පැවති තත්වය ඉහත සඳහන් වත්කම් සහ බැරකම් ප්‍රකාශයෙහි සත්‍යව සාධාරනව පෙන්නුම් කර තිබෙන බවත් මාගේ අදහස වග මෙයින් පළකර සිටිමි.

මේ වගට,
ඩී. එස්. ද සිල්වා,
ඔඩිටර් ජනරාල් වෙනුවට.

1959 මැයි මස 20 වන ද,
කොළඹ 7, ගණන් පරීක්ෂක කාර්‍යාලයයේ දීය.

# විවිධ දැන්වීම්

## ගල්බොඩ කෝරලේ ගම්කාර්‍ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණත (201 වන පරිච්ඡේදය)**

මෙහි පහත විස්තර දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කොට ඇති බවත් මෙම බල පත්‍රය නිකුත් කිරීමට විරුද්ධවන ගල්බොඩ කෝරලේ ගම් ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණු නිසා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දහහතර දිනක් ඇතුලත මාවෙත ලියා එවීමට බලය ඇති බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 201 වන පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥා පනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥා පනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ගම්කාර්‍ය සභා කාර්‍යාලය,
මාවනැල්ල, මැයි 20, 1959.

ඇම්. ආර්. බී. දස්වත්ත,
සභාපති.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | බලපත්‍රයේ ස්වභාවය |
|---|---|---|
| කාදර් ලෙබ්බෙ හම්දු ලෙබ්බේ | අංක 70, අල්පිටිය පාර, මාවනැල්ල .. .. .. | එළු මස් |

## විශෙෂ නිවේදනයයි

1959 ජූනි මාසයේ සිට, ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, ඊට කලින් සතියේ සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙනසේ එවිය යුතුවේ. සඳුදාත් සිකුරාදාත් අතරතුරදී ආණ්ඩුවේ නිවාඩු දිනයක් යෙදෙන්නේ නම් (දෙදිනම ඇතුළුව) එම දැන්වීම් සෙනසුරාදා දවල් 12 ට ප්‍රථම ලැබෙන සේ එවිය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මැයි 15 දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේදීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.